# තනතුරු ඇබෑර්තු

## විශ්‍රාම වැටුප්, සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හිමිවන වයඹ සමුපකාර දැවැන්තයා සමඟ එක් වන්නට ඔබට ඇරයුම්

වයඹ පළාත තුළ මූල්‍ය ක්ෂේත්‍රයේ කටයුතුවල නියැලී සිටින, ද්විතීය මට්ටමේ සමුපකාර සංවිධානයක් වන, සීමාසහිත වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ, පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා මතු දැක්වෙන සුදුසුකම් සපුරා ඇති, වයඹ පළාතේ ස්ථිර පදිංචි කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

## නීති නිලධාරී

| | |
|---|---|
| **වැටුප් පරිමාණ අංකය** | : MEL - iii |
| **වැටුප් පරිමාණය** | : රු. 45,663 - 750 x 10 - 900 x 11 - 1000 x 05 - 68,063 |
| **වෙනත් දීමනා** | : රු. 16,237.00 |
| **වයස** | : අවුරුදු 18 - 45 |
| **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** | : |

(අ). නීතිවේදී උපාධිය සමත්වීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීති වේදියකු වශයෙන් වසර 02කට නොඅඩු සේවා පළපුරුද්ද.

(ආ). ලේකම් පරිචය පිළිබඳ දැනුම හා පරිගණක භාවිතය පිළිබඳ මනා දැනුම අතිරේක සුදුසුකමක් සේ සලකනු ලැබේ.

### ලැබෙන වෙනත් නිත්‍ය හා අමතර ප්‍රතිලාභ

1. විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබීම, උපරිම විශ්‍රාම හිමිකම වැටුප මත 80%.
2. සේවක අර්ථසාධක අරමුදල් සඳහා දළ වැටුප මත ආයතනයෙන් 15% ක දායකත්වය.
3. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා දළ වැටුප මත ආයතනයෙන් 3%ක දායකත්වය.
4. ජීවන ප්‍රතිලාභ අරමුදල සඳහා ආයතනයෙන් මාසික දායකත්වය.
5. වාර්ෂික නිල ඇඳුම් ලබාදීම.
6. අඩු පොලී මත දෙනු ලබන සේවක ණය පහසුකම්, (වාර්ෂික 5% ක පොලී ප්‍රතිශතය මත)
7. සතුටුදායක සේවාව හා වෘත්තීය සුදුසුකම් මත වසර පහෙන් පහට උසස්වීමේ ඉඩකඩ.
8. විදේශ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයෙන් පිරිනමන විදේශ චාරිකා / ශිෂ්‍යත්ව.
9. වාර්ෂික ලාභය මත පදනම් වූ ප්‍රසාද දීමනා.
10. සේවක සුභසාධක යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ.
11. ලබා නොගත් නිවාඩු සඳහා වේතන ගෙවීම.
12. වැඩි දුර අධ්‍යාපනය සඳහා දේශීය ශිෂ්‍යත්ව.

### පොදු කොන්දේසි

අ. අයදුම්කරුවන් මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

ආ. අදාල තනතුර වසර 2ක පරිවාස කාලයකට යටත්ය.

ඇ. දැනට සමුපකාර සේවයේ නියුක්ත වූවන්ට වයස් සීමාව බලනොපාන අතර තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ඈ. සියලුම අයදුම්පත් ඇගයීම් මණ්ඩලයක් මගින් නිරීක්ෂණය කරනු ලැබේ. අපේක්ෂිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් හා / හෝ සම්මුඛ පරීක්ෂණයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන පරිදි ඉදිරිපත් විය යුතුවේ.

ඉ. තනතුර සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම් පත්‍රය තුළ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය. (සම්පූර්ණ නම, මුලකුරු සමග නම, ස්ථිර ලිපිනය, ජා.හැ. අංකය, පදිංචි දිස්ත්‍රික්කය, ග්‍රාම නිලධාරී කොට්ඨාසය, උපන් දිනය, වයස, ස්ත්‍රී / පුරුෂ භාවය, විවාහක / අවිවාහක බව, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද හා දුරකථන අංකය ඇතුළුව අදාල වෙනත් විස්තර)

වැදගත් : අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් ද අනිවාර්යෙන්ම අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය.
2. ලබා ඇති අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික තමන් විසින් සහතික කර එවිය යුතුය.
3. ග්‍රාම නිලධාරී වරයාගෙන් ලබාගත් පදිංචිය සනාථ කෙරෙන සහතිකය.
4. තමා පදිංචි ප්‍රදේශයේ ආගමික මධ්‍යස්ථානයේ ප්‍රධානියාගෙන් ලබා ගත් චරිත සහතිකය.

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තමා විසින්ම පිළියෙල කරගත් අයදුම් පත් තම ලිපිනයැති 9 x 4 ප්‍රමාණයේ මුද්දර ඇලවූ ලියුම් කවරයක් ද සමඟ 2023.06.02 දින ප.ව. 12.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.

අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළෙවරේ අදාල තනතුරු නාමය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.

අවසන් දිනෙන් පසුව ලැබෙන හා ඉල්ලුම් කර ඇති තොරතුරු රහිත ඉල්ලුම් පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

WCRB

ගරු සභාපති,

**සීමාසහිත වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය**

ග්‍රාමීය බැංකු මන්දිරය, 107, දඹුල්ල පාර, කුරුණෑගල.

දුරකථන : 037-2234150/2 / 037-2226191/2 ෆැක්ස් : 037-2234153